**ලංකා සතොස ලිමිටඩ් සමාගම - 2017**

**---------------------------------------------------------------------------------**

ලංකා සතොස ලිමිටඩ් සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2007 අංක 07 දරන සමාගම් පනතේ 150 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් ඉදිරිපත් කළ යුතු මූල්‍ය ප්‍රකාශන 2018 සැප්තැම්බර් 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**-----------------------------------------------------------------------**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------------

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 සැප්තැම්බර් 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

-------------------------------------

සමාගම විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශන අයිතමය | වටිනාකම |
|---|---|
| වත්කම් | රු |
| ජංගම නොවන වත්කම් | 949,040,152 |
| ජංගම වත්කම් | 10,195,466,639 |
| මුළු වත්කම් | 11,144,506,791 |
| ස්කන්ධය හා වගකීම් | |
| ස්කන්ධය | (3,033,662,184) |
| වගකීම් | |
| ජංගම නොවන වගකීම් | 248,673,144 |
| ජංගම වත්කම් | 13,929,495,831 |
| | --------------------- |

| | |
|---|---|
| මුළු ස්කන්ධය හා වගකීම් | 11,144,506,791 |
| | =========== |
| මුළු ආදායම | 28,277,487,951 |
| මුළු වියදම | (30,222,740,973) |
| අලාභය | (1,945,253,022) |

ආනයනික සහල් තොග හානි ඇතුලුව තොග සම්බන්ධයෙන් වූ අලාභ හේතුවෙන් 2014 වර්ෂයේ සිට ස්කන්ධය සෘණ අගයක් බවට පත්වී තිබූ අතර ස්කන්ධයේ පවතින අහිතකර තත්ත්වයත් ජංගම වත්කම් ඉක්මවූ ජංගම බැරකම් පැවතීමත් නිසා සමාගමේ අඛන්ඩ පැවැත්ම සම්බන්ධයෙන් අවිනිශ්චිත තත්ත්වයක් පැවතුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | නිල වාහන භාවිතා කිරීම සඳහා හිමිකම නොමැති නිලධාරීන් 19 දෙනෙකුට යොමුගත චක්‍රලේඛයට පටහැනිව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ප්‍රවාහන දීමනා ගෙවා තිබූ අතර එලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ ප්‍රවාහන දීමනාව රු.1,672,500 ක් විය. |
| (ආ) 2017 ඔක්තෝබර් 25 දිනැති අංක 05/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | රජය සතු සමාගම්වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා සේවා කාලය මත පදනම්ව යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව ගෙවිය හැකි වෘත්තීය දීමනා, අනුප්‍රමාණයන් ඉක්මවා නිලධාරීන් 09 දෙනෙකුට 2017 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා රු.412,600 ක් ගෙවා තිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 වගන්තිය ප්‍රකාරව, ලබාගත යුතු භාණ්ඩාගාර අනුමැතියකින් තොරව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ප්‍රධාන විධායක නිලධාරී සඳහා මාසිකව රු.100,000 ක සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු සඳහා මාසිකව රු. 75,000 බැගින් නිලධාරීන් 06 දෙනෙකුට කාර්යසාධන දීමනාවක් ගෙවා තිබූ අතර එලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ දීමනා එකතුව රු.5,615,000 ක් විය.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 වගන්තිය ප්‍රකාරව, ලබාගතයුතු භාණ්ඩාගාර අනුමැතියකින් තොරව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත වෘත්තීය

සුදුසුකම් ඉදිරිපත් කරන ලද නිලධාරීන් සඳහා මාසිකව රු.10,000 ක් සහ ප්‍රධාන විධායක නිලධාරී සඳහා මාසිකව රු.100,000 ක් බැගින් වෘත්තීය දීමනාවක් ගෙවා තිබුණි. එලෙස සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 09 දෙනෙකුට ගෙවා තිබූ දීමනා එකතුව රු. 964,333 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

#### 3.1.1 සැලසුම් කිරීම

-----------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව, සමාගමේ දැක්ම හා මෙහෙවර ඉටු කර ගැනීම සඳහා වර්ෂ තුනකට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් හා ඊට අනුරූපව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලසුමක් සහ ක්‍රියාකාරී සැලසුමක් පිළියෙල කර නොතිබුණි. එමෙන්ම චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලසුමට අනුකූල වන පරිදි වාර්ෂික අයවැය ලේඛනයක් සමාලෝචිත වර්ෂයට අදාලව පිළියෙල කර නොතිබුණි.

#### 3.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් සමාගමේ නව අලෙවිසැල් ආරම්භ කිරීම, අලෙවිසැල් අලුත්වැඩියා කිරීම, ආරක්ෂිත කැමරා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් ඇති කිරීම, අලෙවිසැල් පරිගණකගත කිරීම, මානව සම්පත් තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ මන්නාරමේ අලෙවිසැලක් ඉදිකිරීම යන ප්‍රාග්ධන කාර්යයන් සඳහා රු.මිලියන 850 ක ප්‍රතිපාදන ලබා දී තිබුණද ඉන් රු.මිලියන 424.1 ක්, එනම් සියයට 49.8 ක්ම නව අලෙවිසැල් ආරම්භ කිරීම සඳහා වැය කර තිබුණි. නව අලෙවිසැල් 150 ක් ආරම්භ කිරීම සඳහා ප්‍රතිපාදන ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට විවෘත කර තිබූ නව අලෙවිසැල් සංඛ්‍යාව 67 ක් විය.

(ආ) නව අලෙවිසැල් විවෘත කිරීමෙන් විකුණුම් සහ ලාභදායිත්වය වර්ධනය කර ගැනීම අපේක්ෂා කළද පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලෙවිසැල් සංඛ්‍යාව සියයට 20.8 කින් වර්ධනය වන විට විකුණුම් ආදායමේ වර්ධනය සියයට 10.7 ක් බව නිරීක්ෂණය විය.

### 3.2 වෙනත් රාජ්‍ය ආයතන සඳහා ලබා දුන් ආයතනයේ සම්පත්

----------------------------------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 වගන්තියට පටහැනිව , අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සමාගමේ කාර්ය මණ්ඩලයේ 17 දෙනෙකු 2017 ජනවාරි සිට ජූලි දක්වා රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර එම නිලධාරීන්ගේ වැටුප් හා දීමනා වශයෙන් රු. 2,594,340 ක් සමාගම විසින් ගෙවා තිබූ අතර එම වියදම ප්‍රතිපූරණය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

**3.3 කළමණාකරන ක්‍රියාකාරකම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අලෙවිසැල්වල තොග සම්බන්ධ අභ්‍යන්තර පාලනයේ පවතින දුර්වලතාවය හේතුවෙන් තොග අලාභ නිවැරදිව ගණනය කිරීමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී සමාගමේ අලෙවිසැල් 10 ක සොරුබිදීම් සම්බන්ධයෙන් රක්ෂණ වන්දි අයදුම් කිරීම සඳහා හඳුනාගෙන තිබූ අලාභය රු.4,625,526 ක් වුවද ඊට අදාලව ලබාගත හැකි වූ රක්ෂණ වන්දි මුදල් එකතුව රු.1,026,666 ක් පමණක් විය. එමෙන්ම අදාල අලාභයන් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන අලාභ අය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) කුරුණෑගල මල්ලවපිටියේ ලංකා සතොස අලෙවිසැල පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත ලබා ගෙන තිබූ ගොඩනැගිල්ල සඳහා අවුරුදු 03 ක් වූ බදු කාලසීමාව අවසන් වී තිබුණද, අදාල ගිවිසුම අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. ගිවිසුම අවසන් කර ගැනීමකින් තොරව 2016 නොවැම්බර් සිට 2017 දෙසැම්බර් දක්වා මාසිකව රු.100,000 බැගින් මාස 14 ක් සඳහා ගෙවා තිබූ කුලී මුදල රු.1,400,000 ක් විය.

**3.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

--------------------------------

සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය 4,186 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ තත්‍ය කාර්ය මණ්ඩලය 3,784 ක් වූ අතර ඒ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාගමේ අලෙවිසැල් වර්ධනයවීමත් සමඟ ඊට අනුරූපව සමාලෝචිත වර්ෂයේදි කාර්ය මණ්ඩලය අනුමත කරවා ගෙන තිබුණද, ඒ අනුව බඳවා ගැනීම් සිදු කර නොතිබීම හේතුවෙන් 1,024 ක කාර්ය මණ්ඩල ඌනතාවයක්ද අනුමත නොවූ තනතුරු සඳහා බඳවා ගැනීම හේතුවෙන් 622 ක අතිරික්තයක්ද පැවතුණි

.

(ආ) 2016 වර්ෂයේදී කළමනාකරණ විශේෂඥයින් වශයෙන් රේඛීය අමාත්‍යාංශයට බඳවා ගනු ලැබූ නිලධාරීන් තිදෙනෙකු විවිධ කාර්ය පැවරුම් සඳහා සමාගම වෙත අනුයුක්ත කර තිබූ අතර එම නිලධාරීන්ගේ දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් රු. 930,000 ක් ගෙවා තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------------

**4.1 වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීම**

-------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 133 ඡේදය ප්‍රකාරව සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් ලිත් වර්ෂයකට වරක් මහා සභා රැස්වීමක් කැඳවිය යුතු වුවත් සමාගම ආරම්භ කරන ලද 2005 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2018 සැප්තැම්බර් 30 දක්වා කාලපරිච්ඡේදය තුළ පවත්වා තිබුණේ එක් මහා සභා රැස්වීමක් පමණක් විය.

**4.2 නොවිසඳී ඇති විගණන ඡේද**

---------------------------------

සමාගමට අදාලව 2014 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 4.3 ඡේදයෙන් පෙන්වා දුන් පහත සඳහන් අඩුපාඩු සම්බන්ධයෙන් සමාගම විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 ඡේදය ප්‍රකාරව සමාගමේ අනුමත කාර්ය මණ්ඩලයට අනුරූප සංවිධාන ව්‍යුහයක් හා 9.3 ඡේදය ප්‍රකාරව බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කර නොගැනීම සහ අවිධිමත් පරිදි බඳවා ගැනීම් හා උසස් කිරීම් සිදු කිරීම.

**4.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

---------------------------------------------

**4.3.1 ප්‍රසම්පාදනයන්**

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් එහි අලෙවි කටයුතු පවත්වාගෙන යාම සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශවලින් කුලී පදනම මත ලබා ගෙන තිබූ ගොඩනැගිලි, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ලබා ගෙන තිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබූ කුලී මුදල රු.476,497,648 ක් විය.

(ආ) කුලී වාහන සැපයීම වෙනුවෙන්, ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව තෝරා ගෙන තිබූ කුලී වාහන සැපයුම් ආයතනයක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,562,730 ක් ගෙවා තිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

--------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| <u>පද්ධති හා පාලන ක්ෂේත්‍ර</u> | <u>නිරීක්ෂණ</u> |
|---|---|
| (අ) ප්‍රසම්පාදන කටයුතු පාලනය | ප්‍රසම්පාදන කටයුතුවලදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් අනුගමනය කර නොතිබීම. |
| (ආ) මානව සම්පත් පාලනය | අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් නොතිබීම සහ අවිධිමත් ලෙස බඳවා ගැනීම් හා උසස් කිරීම් සිදු කිරීම. |
| (ඇ) අයවැය ලේඛනමය පාලනය | වාර්ෂික අයවැය ලේඛන පිළියෙල නොකිරීම නිසා පාලන කාරකයක් ලෙස භාවිතා කිරීමට නොහැකි වීම. |
| (ඇ) ඉන්වෙන්ට්‍රි පාලනය | නිවැරදි තොග වාර්තා පවත්වා ගැනීමට කටයුතු නොකිරීම. |